# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/5/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2021.04.16 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ :- 2021/09-1**

සියලුම විධායක කමිටු /පාලක මණ්ඩල සභාපතිවරුන්,

සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන්.

**<u>Covid - 19 ව්‍යවසනකාරි තත්ත්වය නිසා බලපෑමට ලක් වූ පවුල්වලට 5000/- ක දීමනාවක් ගෙවීම.</u>**

අග්‍රාමාත්‍ය ලේකම් විසින් නිකුත් කරන ලද PTF/03-2021 දරණ 2021.04.10 දිනැති හා ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ 2021/09 මගින් ලබා දී ඇති උපදෙස් පරිදි රු.5000/- යේ සමාජ ප්‍රතිලාභය ගෙවීම සඳහා සියලුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙත අදාල මුදල් ලබා දී ඇත. එම මුදල් පහත කාණ්ඩවලට අයත් පවුල්වලට ගෙවීම් කිරීමට උපදෙස් ලබා දී ඇත.

1. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්
2. අඩු අදායම්ලාභීන් ලෙස හඳුනාගෙන ඇති පවුල්.
3. වැඩිහිටි දීමනා ලබන පුද්ගලයින් සිටින පවුල්.
4. අබාධිත දීමනා ලබන පුද්ගලයින් සිටිනි පවුල්.
5. වකුගඩු රෝගී තත්ත්වය හේතුවෙන් දීමනාව ලබන පුද්ගලියන් සිටින පවුල්.
6. සියවස් පූර්ණ වැඩිහිටි දීමනාව ලබන පුද්ගලයින් සිටින පවුල්.
7. අභියාචනා ඉදිරිපත් කර සුදුසුකම් ලැබූ පවුල්.

02. ඉහත අංක 3,4,5,6 යටතට ගැනෙන පවුල්වලින් වැඩි කොටසක් සමෘද්ධිලාභී පවුල් හා අඩු අදායම්ලාභී පවුල් යටතේ ප්‍රතිලාභ ලබාගෙන ඇති බව අප වෙත වාර්තා වේ. ඒ අනුව තවදුරටත් ගෙවීමට ඉතිරිව ඇති පවුල් සංඛ්‍යාව ඉතා සීමිත බව පෙනී යයි. එනම් ඉහත අංක 3,4,5,6 යටතට ගැනෙන පවුල්වලින් තවදුරටත් ගෙවීමට ඇත්තේ 30% කටත් වඩා අඩු ප්‍රමාණක් බව ලැබෙන තොරතුරු වලින් පැහැදිළි වේ. එම නිසා ඉහත කාණ්ඩ 3,4,5,6 ට අදාල පවුල් සංඛ්‍යාවෙන් 30% කට අදාල මුදල් සමෘද්ධි බැංකුව වෙත මේ සමග ලබා දී ඇත.

03. මේ වන විට ඇතැම් බැංකු වෙත ගෙවීමට ඇති ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකට මුදල් ලැබී ඇති බව වාර්තා වේ. එම මුදල් මහජන බැංකුවේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රජාමූල බැංකු ඉතිරි කිරීමේ ගිණුම් නම දරණ අංක 208100100329821 හා ලංකා බැංකුවේ අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නම දරණ ගිණුම් අංක 7041562 දරණ ප්‍රධාන කාර්යාලයේ ගිණුම්වලට කඩිනමින් එවිය යුතු බව ද දන්වමි. ඔබ බැංකුවට ලංකා බැංකු ගිණුම මගින් මුදල් ලැබුනේ නම් ඉහත ලංකා බැංකුගිණුමටත්, මහජන බැංකු මගින් මුදල් ලැබුනේ නම් ඉහත මහජන බැංකු ගිණුමටත් එවිය යුතුය. ඒපිළිබඳ විස්තර දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙතින් ලබා ගන්නා ලෙසද දන්වමි.

04. ඒ අනුව මූලිකව ඔබ බැංකුව විසින් ගෙවිය යුතු යම් මුදලක ඌනතාවයක් ඇත්නම් එය ඔබ බැංකු වෙත එවීමට කටයුතු කරනු ඇත. ඉහත කාණ්ඩවල 1,2 ට අයත් පවුල් සඳහා මෙම ලබාදෙන උපදෙස් හරි ආකාරව පිළිපදින ලෙස


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

දන්වන අතර, බැංකු විසින් ගෙවීම් කරන ලද ලේඛන ඉතා නිවැරදිව සකස් කර තබා ගන්නා ලෙසත්, ඉල්ලා ඇති වාර්තා නිසි ලෙස සකස් කර ප්‍රධාන කාර්යාලයට එවන ලෙසත් කාරුණිකව දන්වමි.

05. සුදුසුකම් ලැබූ අභියාචනා පවුල් කාණ්ඩයට අදාල ප්‍රමාණය තවම නිශ්චිතව හඳුනාගෙන නැති බැවින්, එම ප්‍රමාණය නිශ්චිතව හඳුනාගත් පසු එම මුදල බැංකු වෙත ලබාදීමට කටයුතු කරනු ඇත. ඒ සඳහා බැංකු කලාප මට්ටමින් සකස් කරන වාර්තාව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතුය.

06. මෙය සාර්ථක කර ගැනීමට ඔබ දක්වන උනන්දුව හා කැපවීම අගය කරන බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

ආර්.පී බී තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල් .

පිටපත් :-

1. ජනාධිපති ලේකම්.
2. අග්‍රාමාත්‍ය ලේකම්.
3. අමාත්‍ය මණ්ඩල ලේකම්.
4. විගණකාධිපති.
5. ලේකම්, මුදල් අමාත්‍යාංශය. - කා.දැ.ස
6. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය.
7. ලේකම්. ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.
8. අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්, සම ලේකම්, ආර්ථික පුනර්ජීවන හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය.
9. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය. - කා.දැ.ස හා අ.ක.ස.
10. දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
11. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.
12. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
13. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස
14. දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන්/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්. - අ.ක.ස